076

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන

6 වන මට්ටම 2019/2020

අවසාන පරීක්ෂණය - 2021

SNU6224/ESU4124 - අධ්‍යාපන කළමනාකරණය

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.05.02 වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. කළමනාකරණ සංකල්පය සුදුසු නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න.

02. හෙන්රි මින්ට්ස්බර්ග් (Henry Mintzberg) ට අනුව කළමනාකරුවකුගේ ප්‍රධාන භූමිකා සඳහන් කරන්න.

03. එෆ්.ඩබ්ලිව්.ටේලර් (F.W.Taylor) විසින් හඳුන්වා දුන් විද්‍යාත්මක කළමනාකරණ න්‍යායයේ මූලධර්ම පහක් (05) සඳහන් කරන්න.

04. "සංවිධානයක අරමුණු සාධනය බොහෝවිට සංකීර්ණ විය හැකිය." එවැනි සංකීර්ණත්වයකට බලපෑ හැකි හේතු තුනක් (03) සඳහන් කරන්න.

05. අභ්‍යන්තර කාර්යක්ෂමතාව හා බාහිර කාර්යක්ෂමතාව යන සංකල්ප උදාහරණ සහිතව වෙන්කොට දක්වන්න.

06. "පාසලට නායකත්වය සපයන විදුහල්පතිවරයා පළමු පෙළ රේඛීය කළමනාකරුවකු වශයෙන් සලකනු ලැබේ." විදුහල්පතිවරයකුගෙන් අපේක්ෂා කරනු ලබන නායකත්ව ගුණාංග පහක් (05) සඳහන් කරන්න.

07. බ්ලේක් සහ මවුටන් (Blake & Mouton) ගේ කළමනාකරණ ජාලය (the Management Grid) ට අනුව 9.9 නායකත්ව ශෛලිය කළමනාකරුවකුට යෝග්‍යතම නායකත්ව ශෛලිය වේ. මෙම නායකත්ව ශෛලියේ දී කළමනාකරුවකුගේ භූමිකා පහක් **(05)** සඳහන් කරන්න.

08. "ජාතික මට්ටමේ දී අධ්‍යාපන අමාත්‍යාංශය අධ්‍යාපන පරිපාලනය සම්බන්ධයෙන් වගකීම් දරන්නා වේ." ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ පරිපාලන වගකීම් පහක් **(05)** සඳහන් කරන්න. (ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. "පාසලක ඵලදායිතාව තීරණය වන්නේ එම පාසල හඳුනාගත් හා පැහැදිලිව ප්‍රකාශිත ඉලක්ක කරා කොතරම් දුරට ළඟා වන්නේ ද යන්න මතය."

(i) ඵලදායී පාසලක් යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ ඵලදායී පාසලක ගති ලක්ෂණ හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ පාසල්වල ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා යෝජනා හතරක් **(04)** ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

10. (i) කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන මූලිකාංග හතර **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) එක් මූලිකාංගයක් තෝරාගෙන එය පාසලේ කළමනාකරණ ක්‍රියාවලියට කොතරම් වැදගත් වන්නේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) තෝරාගත් මූලිකාංගයට අදාළව ගැටලු/ අභියෝග දෙකක් **(02)** හඳුනාගෙන එම ගැටලු/අභියෝග මගහරවා ගැනීම/අවම කිරීම සඳහා යෝග්‍ය විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 10)

11. "අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පාසල් මට්ටමේ අධීක්ෂණය කාලෝචිත අවශ්‍යතාවයකි."

(i) පාසල් මට්ටමේ අධීක්ෂණ ක්‍රියාවලියේ අරමුණු හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඔබ අධීක්ෂකවරයෙක් යැයි උපකල්පනය කරන්න. පන්තිකාමර අධීක්ෂණ ක්‍රියාවලිය සඳහා ගුරුවරයා සහ ශිෂ්‍යයා යන දෙපාර්ශවයම සැළකිල්ලට ගනිමින් කුඩා නිරීක්ෂණ නියමාවලියක් (Observation Schedule) සකස් කරන්න. (ලකුණු 06)

(iii) පන්ති කාමර අධීක්ෂණයේ දී ඵලදායි අධීක්ෂකවරයකුගෙන් අපේක්ෂා කරනු ලබන ගුණාංග හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(iv) ස්වයං ඇගයීම (self – evaluation) යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි දක්වා, ගුරුවරයකුට එහි ඇති වැදගත්කම් දෙකක් **(02)** සඳහන් කරන්න. (ලකුණු 06)

12. (i) මැක්ස් වෙබර් (Max webber) ඉදිරිපත් කළ නිලබලවාදී ආකෘතියේ (Bureaucracy Model) ලක්ෂණ සඳහන් කරන්න. (ලකුණු 06)

(ii) පාසල් කළමනාකරණ ක්‍රියාවලියේ දී එම ආකෘතියේ අදාළත්වය උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 14)

13. "එෆ්.ඩබ්.ටේලර් ට අනුව කළමනාකරණ පුහුණුව කළමනාකරණ ක්‍රියාවලියේ විද්‍යාත්මක ක්‍රම භාවිතය මත පදනම් විය යුතුය."

(i) විදුහල්පතිවරයෙකුට කළමනාකරණ පුහුණුව අවශ්‍ය වන්නේ ඇයි ? (ලකුණු 06)

(ii) කළමනාකරණ පුහුණුවක දී සළකා බැලිය යුතු ක්ෂේත්‍ර/අංශ හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රයට ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් (04) සඳහන් කර, ඉන් එකක් **(01)** පිළිබඳව උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

14. (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණ ක්ෂේත්‍රයේ ගැටලු ඇතිවීමට බලපා ඇති සාධක හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණ ක්ෂේත්‍රයේ ගැටලු ඇතිවීමට බලපා ඇති සාධක හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ඔබ ඉහත (14.i) හි සඳහන් කළ ගැටලුවලින් දෙකක් **(02)** තෝරාගෙන, එම ගැටලු මඟහරවා ගැනීම/අවම කිරීම සඳහා යෝග්‍ය විසඳුම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.